# රිච්මන්ඩ් විද්‍යාලය - ගාල්ල
## 3 ශ්‍රේණිය - 2020
## පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම්
## පළමු වාර පාඩම් අභ්‍යාස - 02 ( පිළිතුරු )

# 04- අප අවට සතුන්

09. සතුන්ට තිබෙන විශේෂ හැකියාවලට අයත් අංකය සතා ඉදිරියේ ඇති වරහනෙහි ලියන්න.

| | |
|---|---|
| ❖ ගිරවා ( 2 ) | 01. ගසකින් ගසකට පැන යාම. |
| ❖ කොට්ටෝරුවා ( 6 ) | 02. යම් යම් දේ කැපීමට ඇති හැකියාව. |
| ❖ වඩුකුරුල්ලා ( 4 ) | 03. මල්වලින් රොන් ගෙන ඒවා වදවල තැන්පත් කිරීම. |
| ❖ බට්ටිච්චා/පැණිකුරුල්ලා ( 8 ) | 04. නිර්මාණශීලී කූඩු තැනීමේ හැකියාව. |
| ❖ වඳුරා ( 1 ) | 05. ආරක්ෂාව සඳහා සඳහා සැඟවීමේ හැකියාව. |
| ❖ ගෙම්බා/සර්පයා/හූනා ( 7 ) | 06. ගසක් සිදුරු කිරීමේ හැකියාව. |
| ❖ කටුස්සා ( 10 ) | 07. දිගු දිව යොදා ගනිමින් ගොදුරු අල්ලා ගැනීම. |
| ❖ ඉබ්බා/ගොළුබෙල්ලා ( 5 ) | 08. සියුම් ලෙස කූඩු තැනීමේ හැකියාව. |
| ❖ මී මැස්සා ( 3 ) | 09. මැටිවලින් විශාල තුඹසක් තැනීමේ හැකියාව. |
| ❖ වේයා ( 9 ) | 10. ආරක්ෂාව සඳහා ශරීරයේ පැහැය වෙනස් කර ගැනීමේ හැකියාව |

10. සුවිශේෂ හැකියාවන් සඳහා සතුන්ට ලැබී ඇති ශරීර අංග 5ක් නම් කරන්න.

| | |
|---|---|
| 01. | හොටය |
| 02. | වලිගය |
| 03. | ස්පර්ශක |
| 04. | දිව |
| 05. | ශරීරය වසා ඇති පිහාටු |

11.පහත ගීතවලින් කියැවෙන සතුන් නම් කරන්න.

| | |
|---|---|
| මෙන්න මෙතන කූඹි රැලක්<br>ගුලක් හදනවා<br>අන්නඅතන වේයො රැලක්<br>හුඹස් බඳිනවා<br>පුංචි උනත් උන් හැම ලොකු<br>වැඩක් කරනවා<br>පුංචි අපිත් එකතු වෙලා<br>රටක් හදනවා<br><br>.........කූඹි......... , ........වේයා...............<br>පද රචනය - එච්.ඩී. ජයතිලක මයා | ගොළුබෙල්ලා කම්මැලියා<br>ගාට ගාට යනවා<br>එළවළු පැළ ටික කන්නට<br>රෑට රෑට එනවා<br>බය උණා ම අකුළාගෙන<br>ගේ ඇතුළට යනවා<br>ටිකක් ඉඳල බය ඇරුණ ම<br>ආයෙත් ගාටනවා<br><br>...............ගොළුබෙල්ලා.............. |

12. සතුන් නිසා අපට ඇතිවන කරදර තුනක් නම් කරන්න.

1) රෝග බෝවීම
2) ආහාර අපිරිසිදු වීම
3) භෝග විනාශ වීම

13. පහත දැක්වෙන රෝග අපට බෝ කරන සතුන් නම් කරන්න.

| රෝග | සතුන් |
|---|---|
| ඩෙංගු<br>බරවා<br>මැලේරියාව<br>චිකුන්ගුන්යා | ......................මදුරුවා.................................... |
| කොලරාව<br>පාචනය | ......................ගෙමැස්සා................................ |
| ස්වසන රෝග<br>ජලභීතිකාව | ......................බල්ලා...................................<br>......................පූසා.......................................<br>......................වඳුරා.................................... |
| මහාමාරිය<br>මී උණ | ......................මීයා...................................... |
| සමේ රෝග | ......................මැක්කා.................................. |
| සමේ රෝග හා උණ | ......................කිනිතුල්ලා............................ |

14. ආහාර අපිරිසිදු කරන සතුන් 04ක් නම් කරන්න.

| | |
|---|---|
| ගෙමැස්සා | මීයා |
| කැරපොත්තා | ලේනා |

15. පහත සතුන්ගෙන් සිදුවන හානි වලක්වා ගැනීමට කළ හැකි දේවල් ය කරන්න.

| | |
|---|---|
| මදුරුවා | ආහාර වසා තැබීම. |
| ගෙමැස්සා | නිවස පිරිසිදු ව තබා ගැනීම. |
| කැරපොත්තා | බෝවන තැන් විනාශ කිරීම. |

**රෝගවලට ප්‍රතිකාර කරනවාට වඩා රෝග සෑදීම වලක්වා ගනිමු.**

16.පහත තොරතුරු නිවැරදිව වගුවේ වෙන්කර ලියන්න.

1) සතුන්ට පහර දීම.
2) පිරිසිදු කිරීම.
3) ආහාරපාන ලබාදීම.
4) සතුන්ගේ පැවැත්මට අහිතකර දේවල් පරිසරයට මුදා හැරීම.
5) සතුන් සිරකර තැබීම.
6) අවශ්‍ය බෙහෙත් හා එන්නත් ලබා දීම.
7) වාසස්ථාන විනාශ කිරීම.
8) සතුන් දඩයම් කිරීම.
9) ලැව්ගිනිවලදී සතුන් මුදා ගැනීම.
10) විනෝදයට සතුන් මැරීම

| මිනිසුන්ගෙන් සතුන්ට වන හානි |
|---|
| සතුන්ට පහර දීම. |
| සතුන්ගේ පැවැත්මට අහිතකර දේවල් පරිසරයට මුදා හැරීම. |
| සතුන් සිරකර තැබීම. |
| වාසස්ථාන විනාශ කිරීම. |
| සතුන් දඩයම් කිරීම. |
| විනෝදයට සතුන් මැරීම |

| මිනිසුන් විසින් සතුන් රැකබලා ගන්නා ආකාර |
|---|
| පිරිසිදු කිරීම |
| ආහාරපාන ලබාදීම. |
| අවශ්‍ය බෙහෙත් හා එන්නත් ලබා දීම. |
| ලැව්ගිනිවලදී සතුන් මුදා ගැනීම. |
| |

17.පහත උපකරණයේ කොටස් වරහනින් තෝරා එහි අංකය හිස්තැන මත ලියන්න.




01. කාඩ්බෝඩ් පෙට්ටිය
02. නූල්
03. ආකෘති
04. චුම්බක

18.ඉහත උපකරණය සෑදීමට අවශ්‍ය දේවල් මොනවා ද?

| | |
|---|---|
| හිස් කාඩ්බෝඩ් පෙට්ටිය | ඇමුණුම් කටු |
| නූල් | කතුර |
| චුම්බක | ගම් |
| වර්ණ කඩදාසි (ආකෘති සෑදීමට) | |

19. සතුන් රැක ගනිමු මාතෘකාවට ගැළපෙන චිත්‍රයක් අඳින්න.

20. පූසෝ හා මීයෝ ක්‍රීඩාව කරන්න.